**IPRC/16/179**

# අද්භූතය ඇසුරින් දේශපාලනික යථාර්ථය නිරූපණය සඳහා සිංහල පන්සිය පනස් ජාතකකතා රචකයන් සතු වූ සාමර්ථ්‍යය

හෙට්ටි ආරච්චිගේ ගිහාන් මදුශංඛ[1*]

කුරුණෑගල යුගයේ දී පාලි ජාතකට්ඨකථාව ඇසුරින් සිංහල පන්සිය පනස් ජාතකකතා පොත සිංහලට පරිවර්තනය විය. ඒ සඳහා කර්තෘ මණ්ඩලයක දායකත්වය සැපයුණු බව අද්‍යතන විද්වතුන්ගේ ප්‍රමුඛ මතයයි. මෙම කෘතියේ අඩංගු වන්නේ බුද්ධභාෂිත සේ ලියවුණු දෘෂ්ටාන්තකථා සමූහයකි. ජාතකකතා භෞතික හා අභෞතික වශයෙන් විවිධ නිර්ණායකයන්ට අනුව අගය කළ හැකියි. පුද්ගල මානසික ශ්‍රේෂ්ඨතා, දුර්වලතා මෙන් ම මනෝ මූලික ව්‍යාධි පිළිබඳ ව ද අවධානය යොමු කරන ජාතකකතාකරුවෝ සමාජීය අංශයෙන් වැදගත් අන්තර් සබඳතා මෙන් ම ආර්ථික, සමාජ බලවේගයන්හි ගොදුරු බවට පත් වන මානවයන් ගැන පුවත් ද සිය දෘෂ්ටාන්තයන්හි ඇතුළත් කළෝ ය. ජාතකකතා රීතියෙහි එන සුවිශේෂ ලක්ෂණයක් වන්නේ අද්භූතය ඇසුරු කරමින් ඒ ඔස්සේ සමාජීය යථාර්ථ පක්ෂය තියුණු අවධානයට යොමු කරවීමයි. අද්භූතය වනාහි ප්‍රකෘති ජීවන තත්ත්වයේ දී ඇදහිය නොහැකි අයථා ප්‍රපංචයකි. පසුකාලීන සාහිත්‍යයේ දී අද්භූතයට එදිරි ව ගොඩනැගුණු විචාර සංකල්පයක් ලෙස යථාර්ථය හඳුනා ගැනුණ ද හුදු යථාර්ථය සාහිත්‍යික ප්‍රතිනිර්මාණයේ දී ප්‍රමාණවත් නොවන බවට කතිකාවක් ගොඩනැඟී ඇත. ජාතකකතාකරුවන් දේශපාලනික මැදිහත්වීම උදෙසා අද්භූත සංකල්ප පරිභාවිත කිරීම පිළිබඳ ව ද මීට සමීප ව විග්‍රහා කළ හැකි ය. එහි දී ඉඳුරා විවේචනය කිරීමෙන් රාජ උදහසට ලක්විය හැකි පරිපාලනමය දුබලතා මෙන් ම දේශපාලන ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව ද අද්භූත ලක්ෂණ උපයෝගී කර ගෙන ජාතක රචයකයෝ සූක්ෂ්ම ව පෙන්වා දුන්හ. උම්මග්ග, ගණ්ඩතින්දු, රාජෝවාද හා කුක්කුර යන ජාතකකතා, පර්යේෂණ සීමාව වශයෙන් සලකමින් ජාතක රචකයන් දේශපාලනික යථාර්ථය නිරූපණය කිරීම උදෙසා අද්භූත ලක්ෂණ පරිභාවිත කළ ආකාරය හා එහි සාර්ථක-අසාර්ථක භාවය මෙහි දී අධ්‍යයනය කෙරෙයි.

***ප්‍රමුඛ පදඃ*** *කුරුණෑගල යුගය, දෘෂ්ටාන්ත කථා, අද්භූතය, සමාජ යථාර්ථය, දේශපාලන ප්‍රතිසංස්කරණ*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *gihansinhala@gmail.com